සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

1වනඅධියර,4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டம், 4வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st4th floor, **Sethsiripaya ,Battaramulla**

මගේ අංකය / எனதுஇல / **My No** DDD/HO/MF/MIS/08
ඔබේ අංකය / உமதுஇல / **Your No**
දිනය / திகதி / **Date** 2016/12/31

දිවිනැගුම බැංකුවක්‍රලේඛ අංක 2016/12

සියළුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු ,බැංකු සමිති කළමණාකරුවන්,

සියළුම දිස්ත්‍රික් බැංකු විෂය /අධීක්ෂණ කළමනාකරුවන් වෙත

## දිවිනැගුම ප්‍රජාමූල බැංකුශ්‍රේණිගත කිරීම හා ඇගයීම් වැඩසටහන.

### 1. හැඳින්වීම

ශ්‍රී ලාංකික ජන සමාජයේ දිළිදු බව තුරන් කිරීම සඳහා ත්‍රිවිධ සංවර්ධන ප්‍රවේශය(සහනාධාර, ග්‍රාම සංවර්ධන, ණය / බැංකු ) ඔස්සේ ක්‍රියාත්මක කරන ලද සමෘද්ධි සංවර්ධන වැඩ සටහනේ වැදගත්ම ප්‍රවේශය ලෙස සමෘද්ධි බැංකු වැඩ සටහන හඳුන්වා දිය හැකිය.අඩු ආදායම්ලාභීන්ගේ ප්‍රාග්ධන සම්පාදන මූලාශ්‍රයක් වන මෙකී බැංකු පද්ධතියට වසර 20 කට ආසන්න කාලයක් ගත වී ඇත.

මේ වන විට දිවිනැගුම ප්‍රජාමූල බැංකු 1074 ක් හා ප්‍රජාමූල බැංකු සමිති (මහ සංගම්) 331ක් දිවයින පුරා ක්‍රියාත්මක වේ. 2013 අංක 01 දරණ දිවිනැගුම පනත යටතේ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තු පිහිටුවමින් ඊළඟ දශකයට පියවර තබා ඇත.

මෙම බැංකු ජාලය සතු මානව,භෞතික හා මූල්‍ය සම්පත් විශාල ප්‍රමාණයක් දිවිනැගුම ජාතික සංවර්ධන වැඩ සටහනේ මෙහෙයුම් ක්‍රියාවලිය සමග බද්ධ වී ඇත. මෙකී ක්ෂුද්‍ර මූල්‍ය බැංකු පද්ධතිය වසර 06 කට ආසන්න කාලයක් තුළ ඇගයීම් හා පසු විපරම් ක්‍රියාවලියකට ලක් නොවීම හේතුවෙන් කළමනාකරණ ගැටළු රාශියක් උද්ගතවී ඇත. බැංකු සතු වත්කම් නිසි කළමනාකරණ ක්‍රියාවලියකට හසු කරමින් බැංකු ලාභදායී ඒකක බවට පත් කිරීම ඉදිරියේ ඇති ප්‍රධාන අභියෝගයකි.

ජනතාව සතු මුදල් පිළිබඳ වගකියන මෙවැනි මූල්‍ය ආයතනයක් යහ පාලන මූලධර්මයන්ට (GOOD GOVERNANCE PRINCIPLE) වඩාත් අනුගත කරවීම උදෙසාත්, බැංකු ජාලයේ මූල්‍ය ක්‍රියාවලිය කාර්යක්ෂම හා වඩා ඵලදායී ලෙස පවත්වා ගැනීම සඳහාත් බැංකු ශ්‍රේණිගත කිරිම හා ඇගයීම් ක්‍රියාවලිය කඩිනමින් සිදු කිරීම කාලීන අවශ්‍යතාවයක් බව පෙනී යයි.

ඒ අනුව ඇගයීම් ක්‍රියාවලිය හා ශ්‍රේණිගත කිරිම සඳහා සුදුසු ක්‍රමවේදයක් හා නිර්ණායකයන් හඳුන්වා දීම මේ මගින් අපේක්ෂා කෙරේ.

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂජනරාල් / மேலதிகபணிப்பாளர்தலைமையதிபதி / Additional DirectorGeneral | අධ්‍යක්ෂ )පාලන( / பணிப்பாளர்(நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722(Hotline)** |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |

## 1.1 පරමාර්ථය:-

දිවිනැගුම ප්‍රජාමූල බැංකුව සාංසමික යහපාලන මූලධර්මයන්ට (CO-OPERATIVE GOOD GOVERNANCE PRINCIPLE) අනුගත කරමින් තම කොටස්කරුවන්ට, තැන්පතුකරුවන්ට හා සියළුම බැංකු ගණුදෙනුකරුවන්ට ඵලදායි හා කාර්යක්ෂම සේවාවක් ලබාදීම.

## 1.2 අරමුණු:-

I. බැංකුකාර්යමණ්ඩලයඅභිප්‍රේරණයකිරීම.
II. දේශීය ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය තුල ප්‍රමුඛතම සුළු මූල්‍ය බැංකුකරුවා බවට දිවිනැගුම ප්‍රජාමූල බැංකුව පත් කිරීම.
III. බැංකු අතර තරඟකාරීත්වය ඇති කිරීම තුලින් වඩාත් ඵලදායී හා කාර්යක්ෂම මූල්‍ය සේවාවක් තම ගණුදෙනුකරුවන්ට ලබාදීම.
IV. එක් එක්දිවිනැගුම ප්‍රජාමූලබැංකුවේ මූල්‍ය ක්‍රියාකාරිත්වය ඇගයීම.
V. සියළුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු තිරසාර මූල්‍ය ආයතන බවට පත් කිරීම.

## 1.3 ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය :-

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ කළමනාකරණ තොරතුරු ඒකකයමගින් හදුන්වා දෙනු ලබන නිර්ණායකමත පිහිටා එම නිර්ණායක අනුව ගනු ලබන ලකුණු පදනම් කරගෙන දිවිනැගුම ප්‍රජාමූලබැංකු ශ්‍රේණිගත කිරීම හා ඇගයීම කරනු ලැබේ.

ඒ අනුව අදාල බැංකුහා බැංකු සමිති කලමණාකරු සමග බැංකු කේෂ්ත්‍ර කාර්යය මණ්ඩලය, පාලක මණ්ඩලය හා විධායක කමිටුව ද ඇගයීමට ලක් කෙරේ.

## 2.0 නිර්නායක හදුන්වා දීම

දිවිනැගුම ප්‍රජාමූල බැංකුව තවත් මූල්‍ය ආයතනයක් වන අතර, එය බැංකුවක් ලෙසද කටයුතු කරයි. එය වාණිජ බැංකුවක් නොවන අතර, පිළිගත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයකි. මේ වන විට ක්ෂුද්‍ර මූල්‍ය ආයතන රාශියක් ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන අතර, දිවිනැගුම ප්‍රජාමූල බැංකුව යම් විශේෂිත වූ ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයක් ලෙස හදුනා ගැනීම නිවැරදිය. ශ්‍රී ලංකාවේ දිළිදුකම පිටුදැකීමේ වැඩසටහන හා බද්ධ වී ආරම්භ වූ අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ මූල්‍ය සම්පාදනයට දායක වන රාජ්‍ය අනුග්‍රහය සහිත ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයක්ලෙස දිවිනැගුම ප්‍රජාමූල බැංකු සැලකේ. 2013 අංක 01 දරණ දිවිනැගුම පනතින් මෙම ආයතනයෙහි වර්ථමාන ක්‍රියාකාරීත්වය තීරණය වේ.කරුණු මෙසේ හෙයින් දිවිනැගුම ප්‍රජා මූල බැංකුව ශ්‍රේණිගත කිරිමේදි හදුන්වාදෙනු ලබන නිර්ණායක, මෙකී බැංකුවේ අරමුණු මිනුම් කෙරෙන ආකාරයට ගලපා ඇති බව කිව යුතුය.

**2.1 දිවිනැගුම ප්‍රජාමූල බැංකු ඇගයීම හා ශ්‍රේණිගත කිරීමේ නිර්ණායක**

දිවිනැගුම ප්‍රජාමූල බැංකු ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාවලියේදී ක්ෂේත්‍ර 5ක් ඔස්සේ බැංකුවමිනුම් කරනු ලැබේ.

1. තැන්පතු
2. ණය
3. අවධානම්කළමනාකරණය
4. ලාභදායිත්වය
5. බැංකුපරිශ්‍රය

බැංකුවකට ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමානය 100 කී. ඉහත විෂයකේෂ්ත්‍රයන්හි වැදගත්කම අනුව බර තබන ලද ලකුණු ප්‍රමාණය තිරණය කර ඇති අතර, එක්එක් විෂය සඳහා ලබාදෙනු ලබන ලකුණු ප්‍රමානයන් පහත විස්තර කර ඇත.

**1. තැන්පතු - මුළු ලකුණු-30**

| | | | |
|---|---|---|---|
| I. | දිගුකාලීන තැන්පතු (, ළමා, සිසුරක) | - | ලකුණු 10 |
| II. | සාමාන්‍ය තැන්පතු (සාමාජික, සාමාජික නොවන, දිරියමාතා) | - | ලකුණු 10 |
| III. | සජීවිකරණ තැන්පතු (කණ්ඩායම්) | - | ලකුණු 05 |
| IV. | කොටස් ප්‍රාග්ධනය | - | ලකුණු 05 |

**2. ණය - මුළු ලකුණු - 20**

| | | | |
|---|---|---|---|
| I. | පිටහිටි ණය මුදල | - | ලකුණු 10 |
| II. | මුදාහල ණය මුදලේ වර්ධනය | - | ලකුණු 03 |
| III. | මුදාහල ණය සංඛ්‍යාවේ වර්ධනය | - | ලකුණු 02 |
| IV. | ණය කරුවන් අනුපාතය | - | ලකුණු 03 |
| V. | ණය තැන්පතු අනුපාතය | - | ලකුණු 02 |

**3. අවදානම් කළමණාකරණය - මුළු ලකුණු - 20**

(I) **ණය අවධානම් කළමනාකරණය** **ලකුණු 07කි.**

- කල් පසු වූ ණය අනුපාත - ලකුණු 02
- බොල් ණයඅනුපාතය - ලකුණු 02
- බොල් ණය සඳහා වෙන් නොකිරීම් - ලකුණු (-)
- සම්බන්ධිත පාර්ශ්ව වෙත ණය ලබා දිම - ලකුණු (-)
- බොල් ණය ආපසු අයකර ගැනීම් - ලකුණු 03

(II) **ද්‍රවශීලතා අවධානම් කළමනාකරණය - මුළු ලකුණු 01කි.**

- ද්‍රවශීලතා අනුපාතය - ලකුණු 01

(III) **මෙහෙයුම් අවධානම් කළමනාකරණය - මුළු ලකුණු 12කි.**

- කීර්ති නාමය - ලකුණු 05
- ලිපි ගොනු - ලකුණු 04
- තොරතුරු කළමනාකරණය - ලකුණු 03

**4. ලාභදායිත්වය - මුළු ලකුණු - 15**

| | | | |
|---|---|---|---|
| I. | කාලය තුල උපයාගත් ලාභය | - | ලකුණු07 |
| II. | ආදායම තුල ණය පොලී ආදායම | - | ලකුණු 07 |
| III. | වත්කම් මත ගලපන ලද ප්‍රතිලාභ අනුපාතය (AROA) | - | ලකුණු 01 |

**5. බැංකු පරිශ්‍රය - මුළු ලකුණු 15**

- චක්‍ර ලේඛ උපදෙස් පරිදිසකස් කල නාම පුවරු ප්‍රදර්ශනය ලකුණු02
- ආරක්ෂණවිධිවිධාන (තාප්පය,වැට , ස්ථිර අවධානම්රහිත ගොඩනැගිල්ලක් වීම) ලකුණු 02
- මූලික භෞතික සම්පත්ළගා කර ගැනිම ලකුණු02

(FAX, PHOTOCOPPY, T.PHONE,FERNITURES, ETC:)

- අභ්‍යන්තර පිරිසැකැස්ම (S5 සංකල්පය අනුව) ලකුණු 03
- ආකර්ශණිය බැංකුපරිශ්‍රය(බාහිර වටපිටාව ද ඇතුලත්ව) ලකුණු 05
- ගණුදෙනුකරුවන් හාප්‍රජා නායකයින්ට අවශ්‍ය පහසුකම් ලකුණු01

**තැන්පතු :- මුළු ලකුණු 30**

දිවිනැගුම ප්‍රජාමූල බැංකුව මේ වන විට පවත්වාගෙන යනු ලබන අනිවාර්ය ඉතුරුම් හැර අනෙකුත් ස්වේච්ජා ඉතුරුම් මේ යටතේ සලකා බලනු ලැබේ. මෙහිදි **අක්‍රිය ගිණුම්** සංඛ්‍යාව ගණනය කිරීම්වලදී සැලකිල්ලට නොගැනේ. ඒසේ වුවද ඊට අදාල **තැන්පතු ප්‍රමාණය** මුළු තැන්පතු ගණනයේදී සලකා බලනු ලැබේ.

**I. දිගුකාලීන තැන්පතු (ළමා, සිසුරක) - මුළු ලකුණු 10**

නිරන්තර ගණුදෙනු ක්‍රියාවලියේදී දිගුකාලීනව මුදල් ආපසු නොගැනෙන තැන්පතු වර්ග දෙකකි.

සමුච්චිත රැස්කරගෙන ඇති දිගුකාලීන තැන්පතු මුදල සෑම රු.මිලියන 01 කට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 06 කි.

$$\frac{\text{මුළු සමුච්චිත තැන්පතු මුදල}}{\text{රුපියල් මිලියන 01}}$$

කාලය තුල තැන්පතු මුදලේ වර්ධන ප්‍රතිශතය සෑම 10%කට ලකුණු 0.5 බැගින් උපරිම ලකුණු 02කි

$$\text{තැන්පතු මුදලේ වර්ධනය} = \frac{(\text{2016 සමුච්චිත තැන්පතු මුදල} - \text{2015 සමුච්චිත තැන්පතු මුදල}) \times 100}{\text{2015 මුළු තැන්පතු}}$$

කාලය තුල ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය 3.5%කට ලකුණු 0.5 බැගින් උපරිම ලකුණු 02කි.

$$\text{තැන්පතු සංඛ්‍යවේ වර්ධනය} = \frac{(\text{2016 සමුච්චිත ගිණුම් සංඛ්‍යාව} - \text{2015 සමුච්චිත ගිණුම් සංඛ්‍යාව}) \times 100}{\text{2015 මුළු ගිණුම් සංඛ්‍යාව}}$$

**සාමාන්‍ය තැන්පතු ( සාමාජික,සාමාජික නොවන,දිරිය මාතා) - මුළු ලකුණු 10**

මේ දක්වා රැස්කරගෙන ඇති සාමාන්‍ය තැන්පතු මුදල සෑම රු.මිලියන 05 කට ලකුණු 0.5 කට ලකුණු බැගින් උපරිම ලකුණු 06

<u>මුළු සමුච්චිත තැන්පතු මුදල</u>
රු.මිලියන 05

කාලය තුළ තැන්පතු = (2016 සමුච්චිත තැන්පතු මුදල - 2015 සමුච්චිත තැන්පතු මුදල×100
මුදලේ වර්ධනය 2015 සමුච්චිත තැන්පතු මුදල

මෙම ප්‍රතිශතය සෑම 10% කටම ලකුණු 0.5 බැගින් උපරිම ලකුණු 02කි.

ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය =(2016 සමුච්චිත ගිණුම් සංඛ්‍යාව - 2015 සමුච්චිත ගිණුම් සංඛ්‍යාව×100
2015 සමුච්චිත තැන්පතු මුදල

කාලය තුල ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය 3.5%කට ලකුණු 0.5 බැගින් උපරිම ලකුණු 02කි.

**III. සජීවීකරණ තැන්පතු (කණ්ඩායම්) - මුළු ලකුණු 05**

මේ දක්වා රැස්කරගෙන ඇති කණ්ඩායම් තැන්පතු මුදල සෑම රු.මිලියන 03 කට ලකුණු 0.25 බැගින් උපරිම ලකුණු 03

<u>මුළු සමුච්චිත තැන්පතු මුදල</u>
රුපියල් මිලියන 03

කාලය තුළ තැන්පතු මුදලේ වර්ධනය= 2016 සමුච්චිත තැන්පතු මුදල - 2015 සමුච්චිත තැන්පතු මුදල×100
2015 සමුච්චිත තැන්පතු මුදල

මෙම ප්‍රතිශතය සෑම 10% කටම ලකුණු 0.25 බැගින් බැගින් උපරිම ලකුණු 01කි

ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය =(2016 සමුච්චිත ගිණුම් සංඛ්‍යාව - 2015 සමුච්චිත ගිණුම් සංඛ්‍යාව×100
2015 සමුච්චිත තැන්පතු මුදල

කාලය තුල ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය 3.5%කට ලකුණු 0.25 බැගින් උපරිම ලකුණු 01කි.

## IV. කොටස් ප්‍රාග්ධනය - මුළු ලකුණු 05

මේ දක්වා රැස්කරගෙන ඇති කොටස් මුදල සෑම රු.මිලියන 03 කට ලකුණු 0.25 බැගින් උපරිම ලකුණු 03

$$\frac{\text{මුළු සමුච්චිත කොටස් මුදල}}{\text{රු.මිලියන 03}}$$

කාලය තුළ තැන්පතු මුදලේ වර්ධනය = $\frac{(\text{2016 සමුච්චිත තැන්පතු මුදල - 2015 සමුච්චිත තැන්පතු මුදල}) \times 100}{\text{2015 සමුච්චිත තැන්පතු මුදල}}$

මෙම ප්‍රතිශතය සෑම 10% කටම ලකුණු 0.25 බැගින් උපරිම ලකුණු 01කි

ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය = $\frac{\text{2016 සමුච්චිත ගිණුම් සංඛ්‍යාව - 2015 සමුච්චිත ගිණුම් සංඛ්‍යාව}}{\text{2015 මුළු ගිණුම් සංඛ්‍යාව}}$

කාලය තුල ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය 3.5% කට ලකුණු 0.25 බැගින් උපරිම ලකුණු 01කි.

## ණය - ලකුණු 20

දිවිනැගුම ප්‍රජාමූල බැංකුවේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ අඩු ආදායම්ලාභී ව්‍යවසායක ප්‍රජාවට ප්‍රාග්ධන සම්පාදනයයි. ණය යනු බැංකුවේ ලාභ ඉපැයීමේ ප්‍රධාන වත්කම වේ. කල්පසුවූ ණය සහ බොල්ණය රහිත හොඳ ණය කළඹක් පවත්වා ගැනීම බැංකුවේ ප්‍රධාන වගකීම විය යුතු අතර, මෙම තත්වය මිනුම් කිරීම පහත දර්ශක මගින් අපේක්ෂා කෙරේ.

### I. පිටහිටි ණය 10

පිටහිටි ණය මුදලේ සෑම රු.මිලියන 16 කට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10කි.

$$\frac{\text{මුළු පිටහිටි ණය මුදල} \times 100}{\text{රු.මිලියන 16}}$$

### II. ණය මුදලේ වර්ධනය :- ලකුණු 03

ණය මුදලේ වර්ධනය = $\frac{\text{2016 මුදාහල ණය මුදල - 2015 මුදාහල ණය මුදල} \times 100}{\text{2015 මුදාහල ණය මුදල}}$

වර්ධන ප්‍රතිශතය සෑම 10%කටම ලකුණු 01 බැගින් උපරිම ලකුණු 03කි.

**III. ණය සංඛ්‍යාවේ වර්ධනය - ලකුණු 02**

මුදාහල ණය සංඛ්‍යාවේ වර්ධනය = <u>2016 සමුච්චිත ණය සංඛ්‍යාව - 2015 සමුච්චිත ණය සංඛ්‍යාව×100</u>
2015 සමුච්චිත මුදාහල ණය සංඛ්‍යාව

වර්ධන ප්‍රතිශතය සෑම 3.5%කටම ලකුණු 0.5 බැගින් උපරිම ලකුණු 02කි.

**IV. ණය කරුවන් අනුපාතය - ලකුණු 02යි**

බැංකු බල ප්‍රදේශයේ ණය ගලා යාමේ විභවතාව සලකා බලයි.දිවිනැගුම ප්‍රජාමූල බැංකුවේ අරමුණ අඩු ආදායම්ලාභීන් ප්‍රාග්ධන සම්පාදනය තුලින් ජීවනෝපාය සංවර්ධනයට දායක කරවීමයි

ණය කරුවන්ගේ අනුපාතය = <u>පිටහිටි ණය සංඛ්‍යාව× 100</u>
කොටස් සාමාජිකයන් සංඛ්‍යාව

ඉහත සූත්‍රය අනුව 20% ඒකකයකට ලකුණු 0.5 බැගින් උපරිම ලකුණු 02කි

**V. ණය තැන්පතු අනුපාතය - ලකුණු 03**

චක්‍රලේඛ උපදෙස් අනුව ණය තැන්පතු අනුපාතය 80%කි

ණය තැන්පතු අනුපාතය = <u>මුළු පිටහිටි ණය ×100</u>
මුළු තැන්පතු
(මුළු තැන්පතු = කොටස්+සාමාජික+සාමාජික නොවන+ළමා+දිරියමාතා+සමූහ+ සිසුරක
පිටහිටි ණය = පාරිභෝගික,ජීවනෝපාය චක්‍රීය ණය හැර ඉතිරි පිටහිටි ණය ශේෂ
ණය තැන්පතු අනුපාතය 80 ≥100 අතර නම් ලකුණු 03කි
එසේ නොමැති නම් ලකුණු නොමැත. ලකුණු 0කි

**ලාභදායිත්වය - ලකුණු 15**

ආයතනයක් ලාභදායිවන්නේ මෙහෙයුම් ආදායම මෙහෙයුම් වියදමට වඩා වැඩිවන විටය

I. **කාලය තුල උපයාගත් ලාභය (2016.12.31 දිනට)**

<u>මුළු ලාභය</u>

රුපියල් මිලියන 01

(වර්ෂයේ ලාභය සෑම මිලියන 01ටම ලකුණු 01 බැගින් උපරිස ලකුණු 07කි.

**II.ආදායම තුල ණය පොලී ආදායම** = $\frac{\text{ණය පොලී ආදායම}}{\text{මුළු ආදායම}} \times 100$

ණය පොලී ආදායමේ අනුපාතය සෑම 10% සඳහාම ලකුණු 01 බැගින් උපරිම ලකුණු 07 කී.

**III.වත්කම් මත ගලපන ලද ප්‍රතිලාභ අනුපාතය (AROA)** $\frac{\text{ශුද්ධ ලාභය}}{\text{සාමාන්‍ය මුළු වත්කම්}} \times 100$

සාමාන්‍ය මුළු වත්කම්= $\frac{\text{ආරම්භක මුළු වත්කම්} + \text{අවසන් මුළු වත්කම්}}{2}$

වත්කම් මත ගලපන ලද ප්‍රතිලාභ අනුපාතය උපරිම ලකුණු 1 කී, අනුපාතය 1%, නම් ලකුණු 0.5කි.1%ට වඩා

වැඩි නම් උපරිම ලකුණු 01 කි.

**<u>අවදානම් කලමණාකරණය - ලකුණු 20</u>**

මූල්‍ය ස්වයංපෝෂිතභාවය ඇති කිරීම සඳහා බැංකුව තුල ඒ ඒ ඒ විෂයට අදාලව අවධානම කලමනාකරණය කර තිබීම අත්‍යාවශ්‍ය වේ.

දිවිනැගුම ප්‍රජාමූල බැංකු මුහුණ දෙන ප්‍රධාන අවධානම් 03 කලමණාකරණය කර තිබීම පිළිබඳ සලකා බලයි.

1. ණය අවධානම
2. ද්‍රවශීලතා අවධානම
3. මෙහෙයුම් අවධානම

**<u>ණය අවධානම් කලමනාකරණය- ලකුණු 7කි.</u>**

බැංකුවේ ප්‍රධාන වත්කම වූ ණය වල අවධානම අවම කර ගෙන තිබීම මෙහිදි සලකා බලා ඇත.

I. කල් පසු වූ ණය අනුපාත :- ලකුණු 02

පිටිහිටි ණය කළඹේ අවධානම සලකා බලයි.සැබැවින්ම මෙම ඇගයීම සඳහා භාවිතා කරන්නේ අවධානම් ගත ණය කළඹ අනුපාතයයි.(PAR –Portfolio At Risk) ගණනය කිරීම සඳහා කල්පසුවූ ණය මුදලේ මුළු පිටහිටි ණය ශේෂය සලකා බලයි.

කල් පසු වූ ණය ( මාස 09 ට අඩු කල්පසුවූ ණය මුදල් ) ලකුණු 02කි

කල්පසුවූ ණය ප්‍රතිශතය ≤1% නම් ලකුණු 02කි

කල්පසුවූ ණය ප්‍රතිශතය ≤ 2% නම් ලකුණු 01 කි

කල්පසුවූ ණය ප්‍රතිශතය ≤ 3% නම් ලකුණු 0.5 කි

කල්පසුවූ ණය ප්‍රතිශතය 3.1≥10 % නම් ලකුණු 00 කි

කල්පසුවූ ණය ප්‍රතිශතය 10% වඩා වැඩි වන විට උපරිම -5 ක් මුළු ලකුණු ප්‍රමාණයට එකතු වේ

$$\text{කල්පසුවූ ණය අනුපාතය} = \frac{\text{කල්පසුවූ ණය වාරික සහිත මුළු පිටහිටි ණය මුදල් එකතුව}}{\text{මුළු පිටහිටි ණය මුදල}} \times 100$$

කල් පසු වූ ණය නොමැති බැංකු සඳහා සම්පූර්ණ ලකුණු 2ක් ලබා දේ.

**II. බොල් ණය ප්‍රතිශතය- ලකුණු02**

මාස 9 ට වඩා වැඩි පිටහිටි ණය මුදල් මේ යටතේ සලකා බලයි

බොල් ණය ප්‍රතිශතය $\leq$ 0.5% නම් ලකුණු 02 කි

බොල් ණය ප්‍රතිශතය $\leq$ 1% නම් ලකුණු 1කි

බොල් ණය ප්‍රතිශතය $\leq$1.5% නම් ලකුණු 0.5කි

බොල් ණය ප්‍රතිශතය 1.1 $\geq$ 3 % නම් ලකුණු 00 කි

බොල් ණය ප්‍රතිශතය 3% වඩා වැඩි වන සෑම ඒකකයක් සඳහාම -1 බැගින් උපරිම ලකුණු -5කි.

බොල් ණය අනුපාතය = <u>මුළු බොල් ණය ප්‍රමාණයX 100</u>
මුළු පිටහිටි ණය මුදල

**බොල් ණය ආපසු අය කර ගැනීම - ලකුණු 03**

මුළු බොල් ණය ප්‍රමාණයෙන් අය කර ගන්නා සෑම 10%ක් සඳහාම ලකුණු 0.5 බැගින් උපරිම ලකුණු 3කි

<u>2016 අය කර ගත් බොල් ණය ප්‍රමාණයX100</u>
2016 අයකර ගත් බොල් ණය ප්‍රමාණය + 2016 .12.31 දිනට බොල් ණය)

බොල් ණය අනුපාතය "0" වූ බැංකු සඳහා මෙම උපරිම ලකුණු ප්‍රමාණය හිමිවේ) ලකුණු 3

**සම්බන්ධිත පාර්ශ්ව වෙත ණය ලබා දීම පාලනය කිරීම**

සලකා බලන කාලය තුල හඳුනාගත් සේවක අක්‍රමිකතා බොල් ණය හිණුමෙහි ශේෂය රු.50000/-ක් නම් (-1) ක් එකතු වේ.ශේෂය වැඩි වන සෑම රු.50,000/- කටම -1 බැගින් මුළු ලකුණු ප්‍රමාණයට එකතු වේ.

**බොල් ණය සඳහා වෙන් කිරීම**

කිසියම් බැංකුවක් චක්‍ර ලේඛ උපදෙස් අනුව 100% ක් බොල් ණය සංචිත වෙන් කර නැත්නම් ලබා ගන්නා ලද ලකුණු වලට -5 ක් එකතු වේ.

**ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය**

ද්‍රවශීලතා අනුපාතය :- ලකුණු 1කි

අනුපාතය 5% ත් 10 අතර නම් ලකුණු 01 ක් ලබා දේ.

$$\text{ද්‍රවශීලතා අනුපාතය} = \frac{\text{ඉතිරි කිරීමේ ගිණුම+අත ඉතිරි මුදල් ගිණුම+ජංගම ගිණුම}\times 100}{\text{මුළු තැන්පතු}}$$

(චක්‍රලේඛ උපදෙස් අනුව මෙම අනුපාතය 10%ක විය යුතු අතර,ඊට වඩා වැඩිවන සෑම 1%ක් සඳහාම -1 බැගින් එකතු වේ.විශේෂයෙන් මෙහිදී අරමුදල් කළමනාකරණය ,පිළිබඳව හැකියාව සලකා බලයි (FUND MANEGEMENT)

**මෙහෙයුම් අවධානම්කලමනාකරණය - ලකුණු 12කි.**

බැංකු මෙහෙයුම් ක්‍රියාවලියේදී අවදානම කලමණාකරණය කර තිබීම මෙහිදී සලකා බලයි. එනම් මෙහෙයුම් ක්‍රියාවලියේදී චක්‍රලේඛ හා මෙහෙයුම් උපදෙස් සම්බන්ධව බැංකුව දක්වන අනුකූලතාවය (COMPLIANCE) ඇතුළු බැංකුවේ සමස්ථ මෙහෙයුම් අවධානම කළමණාකරණය කර තිබීම මෙහිදී මනිනු ලැබේ. එය පහත සඳහන් කරුණු ඔස්සේ සලකා බලනු ලබයි.

**කීර්තිනාමය : ලකුණු 05**

පහත සඳහන් කරුණු ඔස්සේ බැංකුවේ මෙහෙයුම් අවධානම කළමනාකරණය කර තිබීම සලකා බලයි.

- සලකා බලන කාලය තුල කිසියම් මූල්‍ය වංචාවකට බැංකුව මුහුණ පා නැත්නම් ලකුණු 01 ,මුහුණ පා එම පරීක්ෂණ ඔප්පු වී ඇත්නම් ලකුණු (-1)
- සලකා බලන කාලය තුල බැංකුව නියමිත දිනට මුදල් මුද්දර අදාල ප්‍රතිලාභී ගිණුම් වලට බැර කර නොමැති බැංකු සඳහා ලකුණු - 0.5ක් මුළු ලකුණු වලට එකතු වේ)
- දිස්ත්‍රික් අධීක්ෂණ ඒකකයේ තොරතුරු අනුව ලිඛිතව හෝ දුරකථනයෙන් පැමිණිලි පෙත්සම් ලැබී ඔප්පු වී ඇත්නම් -1 ක් එකතු වේ.නැත්නම් 0
- වසර තුල බැංකුවේ කීර්තිනාමයට ඉවහල් වන සමාජ සත්කාර/නිර්මාණාත්මක වැඩ සටහන් - ලකුණු 01 (සාධක සහිතව තහවුරු කර ගත යුතුය ලකුණු -01)
- විගණන වාර්තා සඳහා ලකුණු 03කි. (සලකා බලන වර්ෂයට පෙර වර්ෂ 3ක (2010,2011,2012) විගණන වාර්තා සඳහා සත්‍ය හා සාධාරණ මතයක් ලැබී ඇත්නම් උපරිම ලකුණු 3හිමිවේ. එසේ නොමැති විගණන වාර්තාවකට -1 ක බැගින් එකතු වේ.(බැංකු පාර්ශවයෙන් වන බලපෑම් පමණක් සලකා බලනු ඇත.

**(2) ලිපි ගොනු ලකුණු - 04**

| |
|---|
| ලිපිගොනු (චක්‍රලේඛගොනු,ප්‍රගතිවාර්තාගොනු)නිවැරදිවයාවත්කාලීනව පවත්වාගෙන යයි-ලකුණු 02<br><br>පහත සදහන් කරුණු සම්පූර්ණ කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දේ.<br><br>යාවත්කාලීන විෂය ගොනු ලේඛන නඩත්තු කිරීම (ලිපි ලැබීම් යැවීම් රෙජිස්තර,පැමිණීමේ ලේඛන,නිවාඩු ලේඛන,බැහැර කෙටි නිවාඩු ලේඛන,ලොග් සටහන් පොත ඇතුළු සියළු අභ්‍යන්තර පරිපාලන ලේඛන,යාවත්කාලීන ලෙජර් නඩත්තුව<br><br>ගොනු හා ලේඛනවල කවරයේ පැහැදිලිව නාමය හා අංකය යොදා තිබීම<br><br>ගොනුවේ ලිපි අංකනය කර තිබීම හා ගොනුවේ ලිපි ක්‍රමානුකූලව අසුරා ගැට ගසා තිබීම<br><br>අධීක්ෂණ නිලධාරියාට යොමු කරන ලිපි සඳහා වාර්තා සටහන් තබා තිබිම<br><br>එක් කරුණක් සම්පූර්ණ විමට ලකුණු 0.5 බැගින් උපරිම ලකුණු 02 කි.<br><br>• බැංකුව තුල සියළුම මාසික ශේෂ පිරික්ෂුම් තුලනය වී ඇත.ලකුණු 1කි<br><br>50% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ශේෂ පරික්ෂණ තුලනය වී නොමැති නම් (-1) ක් ලබා දේ .එසේ නොමැති නම් ලකුණු 0කි<br>පොදු ලෙජරය යාවත්කාලීනව පවත්වාගෙන යන්නේ නම් උපරිම ලකුණු 1ක් එකතු වේ.නැත්නම් -1 ක් මුළු ලකුණු වලට එකතු වේ.<br>අවිනිශ්චිත ගිණුම තුලනය නොවු ශේෂ පිරික්ෂුම් ගිණුමේ ශේෂයක් පැවතීම - ලකුණු (-0.5) හිමි වේ.නැත්නම් ලකුණු නැත. |

**තොරතුරු කළමනාකරණය - ලකුණු 03**

I. යාවත්කාලීන වූ දත්ත පද්ධතියක් ඇත. - ලකුණු 1 (පහත කරුණු සලකා බැලිය යතුය.)
නියමිත දිනට නිවැරදිව සියළුම වාර්තා අදාල ප්‍රජා මූල බැංකු සමිතිය වෙත එවීම, මූලික දත්ත ප්‍රදර්ශනය කර තිබීම හා ප්‍රගති වාර්තා ගොනු පවත්වා ගෙන යාම)

II. ඉදිරි ක්‍රියාකාරී සැලැස්මකට අනුව කටයුතු කරයි. - ලකුණු 01 (ඉදිරි සැලැස්ම සහිත ලිපි ගොනුවක් පවත්වාගෙන යාම හා ඒ අනුව ක්‍රියා කර තිබීම.)

III. ක්‍රමවත්ව පසු විපරම් හා ප්‍රගති සමාලෝචන ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම. (වාර්තා සටහන් හා සහභාගි ලේඛණ සලකා බැලිය යුතුය.) ලකුණු 01

**බැංකු පරිශ්‍රය - ලකුණු 15**

(ඇගයීමේදී/ශ්‍රේණිගත කිරීමේදී මේ යටතේ ලැබෙන ලකුණු ප්‍රමාණය 15කි

| | | |
|---|---|---|
| I. | චක්‍ර ලේඛ උපදෙස් පරිදි සකස් කල නාම පුවරු ප්‍රදර්ශනය | - ලකුණු 02 |
| II. | ආරක්ෂණ විධිවිධාන (තාප්පය,වැට,ස්ථිර අවධානම් රහිත ගොඩනැගිල්ලක් වීම ) | ලකුණු 02 |
| III. | අභ්‍යන්තර පිරිසැකැස්ම (S 5 සංකල්පයට අනුව ) | - ලකුණු 03 |
| IV. | මූලික භෞතික සම්පත් ලගා කර ගැනීම | - ලකුණු 02 |
| V. | ආකර්ශනීය බැංකු පරිශ්‍රය (බාහිර වටපිටාව ඇතුළත්ව) | - ලකුණු 05 |
| VI. | ගණුදෙනුකරුවන් හා ප්‍රජා නායකයින්ට අවශ්‍ය පහසුකම් | - ලකුණු 01 |

**(1)** **ආකෘති සම්පූර්ණ කිරීම :-**

හඳුන්වාදී ඇති ආකෘතියටතොරතුරු ඇතුලත් කිරීම අදාල බැංකු කලමනාකරු විසින් සිදුකල යුතුය. ඇමුණුම අංක 1 මගින් අදාල ආකෘතිය දක්වා ඇත. අදාල බැංකුවට තොරතුරු ඇතුලත් කිරිමේදි බැංකුව අයත් ප්‍රජා මුල බැංකු සමිති කළමනාකරු විසින් එහි අධීක්ෂණය සිදු කල යුතුය.

ඒ ඒ බැංකුවට අදාල තොරතුරු ඇතුලත් කිරීමේදී දිස්ත්‍රික් මාසික බැංකු ප්‍රගති වාර්තා එවනු ලබන බැංකු අනුපිළිවෙලට බැංකුවල නම් ඇතුලත් කිරීමෙන් එම කටයුතු පහසුවන අතර තොරතුරු විශ්ලේෂණය පහසු කරයි. නිවැරදි ආකාරයට තොරතුරු ඇතුලත් නොවූ ආකෘති පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ආකෘති සම්පූර්ණ කිරිමේදි පහත සඳහන් පියවර අනුගමනය කල යුතුය.

I. චක්‍ර ලේඛයේ ඇතුළත් ඇමුණුම අංක 01 ආකෘති පත්‍රය ලබා ගැනීම .
II. මහ සංගමයට අයත් බැංකු ප්‍රමාණයට සමාන ආකෘති පත්‍ර කට්ටලය බැගින් දිවිනැගුම ප්‍රජාමුල බැංකු සමිති කළමනාකරුසකස් කර ගැනීම.
III. නියම කරන දිනයකදී දිවිනැගුම ප්‍රජාමුල බැංකු සමිති කළමනාකරු විසින් තම අධීක්ෂණය යටතේ ඒ ඒ බැංකු කළමනාකරු මගින් තම බැංකුවට අදාල ආකෘති පත්‍රය සම්පූර්ණ කර ලබා ගැනීම ( නිර්ණායක 1,2,3(I) ,3(II),4 )
IV. නිර්ණායක අංක 3(III) හා 5 ලකුණු ලබා දීම කමිටුවක් මගින් සිදු වේ.
V. ප්‍රජාමූල බැංකු සමිතිකළමනාකරු විසින් තම ප්‍රජාමූල බැංකු සමිති බල ප්‍රදේශයට අයත් සියළුම බැංකු වල තොරතුරු ආකෘතියට ඇතුළත් කිරිමෙන් පසු එම ආකෘති පත්‍ර නිසි පරිදි දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත භාරදිම
VI. තම දිස්ත්‍රික්කයේ ඒ ඒ බැංකු වලට අදාලව සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රයේ ඇතුළත් තොරතුරු දිස්ත්‍රික් ආකෘති පත්‍රයට ඇතුළත් කිරීම.(තොරතුරු කළමනාකරණ ඒකකයේ misbank2015@yahoo.comයන ලිපිනයේ samu123123 යන රහස් අංකය භාවිතා කරමින් ලබා ගත හැකිය. )

**3.1** <u>**බාහිර නිරික්ෂණ මත ලකුණු දීම**</u>

අදාල ආකෘතියට තොරතුරු ඇතුලත් කිරීමේදී නිර්ණායක අංක 3(III) හා අංක5 ට අදාලව ලකුණු ලබාදීමේදී ලේඛණ ගත තොරතුරුවලට අමතරව, අනෙකුත් නිරික්ෂණ මත පිහිටා ලකුණු ලබාදීමටසිදුවනු ඇත. තෝරාගන්නා ලද ස්වාධීන කමිටුවක් මගින් අදාල ඇගයීම් සිදුකල යුතුය. එම කමිටුවේ සංයුතිය පහත පරිදි විය යුතුය.කමිටුව අදාල කාර්ය සඳහා තම කොට්ඨාශයට පැමිණෙන අවස්ථාවේදී අදාල ප්‍රාදේශිය ලේකම් කොට්ඨශයේ දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරු සහයෝගය ලබා දිය යුතුය.

3.2 **කමිටුව:-**

පහත සඳහන් සෑම ස්ථරයක්ම නියෝජනව වන පරිදි කමිටුව තෝරා පත්කළ යුතු අතර උපරිම සාමාජික සංඛ්‍යාව 6කි. කමිටුව සඳහා ප්‍රධාන කාර්යාලයට අදාල නිලධාරින් නම් කිරිම ක්ෂුද්‍ර මූල්‍ය අධ්‍යක්ෂ විසින් ද දිස්ත්‍රික්කයට අදාලව නිලධාරින් නම් කිරිම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ විසින් ද ප්‍රාදේශිය මට්ටමට අදාලව නිලධාරින් නම් කිරිම ප්‍රාදේශිය ලේකම් විසින් ද සිදු කල යුතු අතර එම නම් කිරිම් සියල්ල දිවිනැගුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය. (ඇමුණුම 02) ඒ අනුව අදාල රාජකාරි කොටස් පැවරෙනු ඇත.

- ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ නිලධාරින් 02
- දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ හෝ බලය පැවරූ නිලධාරියෙකු
- දිස්ත්‍රික් අධික්ෂණ නිලධාරියෙකු
- අදාල දිස්ත්‍රික්කයේ බැංකු විෂයභාර කළමණාකරු
- ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරු හා මූලස්ථාන / ව්‍යාපෘති

ඒ ඒ ස්ථර වලින් නිළධාරීන් පත් කිරීමෙන් අනතුරුව දිස්ත්‍රික්කය තුළ කමිටුව සකස් කර ගැනීම දිස්ත්‍රික් ලේකම් උපදෙස් පරිදි දිවිනැගුම දිස්ත්‍රික් අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතුය. ප්‍රතිඵල ලේඛන නිකුත් කරන අවස්ථාව දක්වාම දිස්ත්‍රික් ඇගයීම් කමිටුව විසින් අදාල දිස්ත්‍රික්කයට සහයෝගය ලබා දිය යුතුය.

### 3.3 තොරතුරු නිවැරදි බවට සහතික කිරීම

දිස්ත්‍රික්කයේ ඒ ඒ බැංකුවලට අදාල තොරතුරු ආකෘතියට ඇතුලත් කිරීමෙන් පසුව,ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරු විසින් එම තොරතුරුවල සත්‍යතාව පරික්ෂා කල යුතු අතර, අදාල ඇගයීම් ආකෘති පත්‍ර බැංකු මට්ටමින් වෙන වෙනම ගොනු කර දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත භාරදිය යුතුය.අනතුරුව දිස්ත්‍රික් අධික්ෂණ නිලධාරියෙකු විසින් අධික්ෂණය කර තොරතුරු නිවැරදි බවට සහතික කල යුතුය.නිලධාරීන් විසින් අදාල තොරතුරුවල සත්‍යතාවය පිළිබඳ ස්වාධින හා අපක්ෂපාතී ඇගයීමක් කල යුතුය.

දිස්ත්‍රික්කයට අදාලව ප්‍රජාමූල බැංකු සමිති මට්ටමින් තොරතුරු ඇතුලත් ආකෘති පත්‍ර ලැබුණු පසු දිස්ත්‍රිත් බැංකු විෂය කලමනාකරු විසින් දිස්ත්‍රික් ආකෘති පත්‍රයට තොරතුරු ඇතුලත් කල යුතුය.(දිස්ත්‍රික් ආකෘති පත්‍රය ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ තොරතුරු කළමනාකරණ ඒකකයේ misbank2015@yahoo.com යන ලිපිනයේ samu123123යන රහස්‍ය අංකය භාවිතා කරමින් ලබා ගත යුතුය.)

අනතුරුව දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂකගේ පූර්ණ අධීක්ෂණය යටතේ කමිටුවක් මඟින් ප්‍රාදේශීය මට්ටම,දිස්ත්‍රික් මට්ටමට ප්‍රතිඵල ලේඛන සකස් කල යුතුය. කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.
එසේ ඇගයීම් කිරීමෙන් පසුවජාතික මට්ටමේ ඇගයීම් සඳහා දිස්ත්‍රික් ප්‍රතිඵල ලේඛන සමග සියළු ඇගයීම් ආකෘති පත්‍ර ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය(තොරතුරු කළමණාකරණ ඒකකය) වෙත දිස්ත්‍රික් මට්ටමින් ගෙනැවිත් භාරදිය යුතුය. (අදාල විස්තර Pen Drive මඟින් ද ලබාදීමට කටයුතු කරන්න.)

## 4.0 ලකුණු මත පදනම්ව බැංකු ශ්‍රේණිගත කිරීම හා ඇගයීම

මෙම ශ්‍රේණිගත කිරිම කාණ්ඩ 4 ක් යටතේ සිදුකරනු ලබන අතර එය පහත පරිදි වේ.

### 4.1 ලකුණු දීමේ ක්‍රියා පටිපාටිය අනුව බැංකු ශ්‍රේණිගත කිරීම,

| | | | | |
|---|---|---|---|---|
| මුළු ලකුණු 75 හෝ ඊට වැඩි | - | විශිෂ්ඨ | - | A ශ්‍රේණිය |
| මුළු ලකුණු 65 ≥75 | - | සතුටුදායක | - | B ශ්‍රේණිය |
| මුළු ලකුණු 50≥65 | - | සාමාන්‍ය | - | C ශ්‍රේණිය |
| මුළු ලකුනු 50 ට අඩු | - | විශේෂ අවධානය යොමු කල යුතු | - | D ශ්‍රේණිය |

සමස්ථ බැංකු පද්ධතිය තුල ඉහත ආකාරයට ලකුණු ලබාගනු ලබන ඕනෑම බැංකුවක් පොදුවේ ඒ ඒ ශ්‍රේණියට අයත් වන අතර, මින් ඉදිරියට සෑම වසරකම සලකා බලනු ලබන නිර්ණායක මත පදනම්ව ශ්‍රේණි ගත කිරීම සිදුවේ. (කාලීනව නිර්ණායක සංශෝධනය විය යුතුය) එහි දී සලකා බලන කාලය තුල අදාල නිර්ණායක මත ලබා ගනු ලබන ලකුණු අනුව යම් බැංකුවක් ඊට පහල ශ්‍රේණියකට පත් විය හැකිය. එබැවින් නිරන්තර ඉහල ශ්‍රේණියකට යාමට බැංකු කලමණාකාරිත්වය කටයුතු කල යුතුය.

## 5.0 බැංකු ඇගයීම

තවද බැංකු ශ්‍රේණිගත කිරීමට සමගාමීවප්‍රාදේශියමට්ටමින් දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් එම බැංකු ඇගයීම් ක්‍රියාවලියක්ද ක්‍රියාත්මක කෙරේ.

**5.1 ප්‍රාදේශීය මට්ටම :-**

ඉහත නිර්නායක මතම පිහිටා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැඩිම ලකුණු ලබාගන්නා බැංකු 3 ක් පිළිවෙලින් තෝරාගෙන ඇගයීමට ලක් කෙරේ. එහිදි අවම ලකුණු මට්ටම 50 ක් හෝ ඊට වැඩි විය යුතුය.

**5.2 දිස්ත්‍රික් මට්ටම :-**

ඉහත නිර්නායක මතම පිහිටා දිස්ත්‍රික්කයේ වැඩිම ලකුණු ලබාගන්නා බැංකු 3 ක් පිළිවෙලින් තෝරාගෙන ඇගයීමට ලක් කෙරේ. සාපේක්ෂ වශයෙන් බැංකු සංඛ්‍යාව වැඩි දිස්ත්‍රික්ක සඳහා ඇගයීමට ලක් කෙරෙන බැංකු තෝරා ගැනීමේදී ඊට අදාල සාධාරණයන් ඉටු කරනු ඇත. එනම් සාපේක්ෂ වශයෙන් වැඩි බැංකු ප්‍රමානයක් ඇගයීම් සඳහා තෝරා ගැනේ. එහිදි අවම ලකුණු මට්ටම 65 ක් හෝ ඊට වැඩි විය යුතුය.

බැංකු 1 – 60 අතර - ස්ථාන 3 (1,2,3)

බැංකු 61 - 90 අතර - ස්ථාන 5 (1,2.3,4,5)

බැංකු 91 - 120 අතර - ස්ථාන 7 (1,2,3,4,5,6,)

**5.3ජාතික මට්ටම**

මෙම නිර්ණායක මතම පිහිටා ජාතික මට්මට වැඩිම ලකුණු ලබාගන්නා බැංකු 3 ක් තෝරා ගනු ලබයි. එහිදි අවම ලකුණු මට්ටම 75 ක් හෝ ඊට වැඩි විය යුතුය.ඊට අතිරේකව ලකුණු 75 ට වැඩිව ලබා ගන්නා සියළුබැංකු කුසලතා සම්මාන සඳහා තෝරා ගැනේ.

බැංකු ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාවලියේදී A,B හා C ශ්‍රේණියට තෝරාගනු ලබන බැංකුවලට හා ඇගයීම් ක්‍රියාවලියේදී විශිෂ්ඨත්වයට පත්වන බැංකු සඳහා හා එම බැංකුවල සියළු නිලධාරින් ඇගයීමට ලක් කෙරෙන අතර එම නිලධාරින් සඳහා තිළිණ හා සහතික පත්‍ර ප්‍රධානය කෙරෙනු ඇත.

**6.0 කාර්ය මණ්ඩල ඇගයීම්**

**6.1 දිස්ත්‍රික් හා ජාතික මට්ටම ඇගයීම් කුසලතා පිරිනැමීම**

දිස්ත්‍රික් මට්ටමේදී බැංකුව ,බැංකුව අයත්වන ප්‍රජාමූල බැංකු සමිතිය ඇගයීමට ලක් කෙරෙන අතර එහි සමස්ථ කාර්යය මණ්ඩලයද ඇගයීමට ලක් කෙරේ. ඊට සමගාමීව අදාල ප්‍රජා සංවිධාන පාලක මණ්ඩලය, ප්‍රජාමූල බැංකු සමිති, විධායක කමිටුව, ඇගයීමට ලක් කෙරේ.ඔවුන් සඳහාද කුසලතා සම්මාන පිරිනමනු ඇත.

ජාතික මට්ටමේදී තේරී පත්වන බැංකුවේ, සමස්ත කාර්යමණ්ඩලය,බැංකුව අයත් ප්‍රජාමූල බැංකු සමිතියේ සමස්ත කාර්ය මණ්ඩලය අදාල ප්‍රාදේශීය ලේකම් ,දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ හා බැංකු විෂයට අදාල සියළු නිලධාරීන් ඇගයීමට ලක් කෙරෙනු ඇත. (බැංකු විෂය, අධීක්ෂණ හා විගණන)

මෙහිදි විශිෂ්ඨ සේවාවක් කල නිලධාරින්ට විශේෂ දිරි ගැන්වීම් ලබාදීමටද යෝජිතය.

**7.0 විශේෂ වැඩ සටහන් සඳහා දක්වන ලද විශේෂ දායකත්වය:-**

**7.1වැඩිම තැන්පතු රාශිකරණය:-**

පසුගිය වසර තුල ප්‍රාදේශීය මට්ටමේ, දිස්ත්‍රික් මට්ටමින් හා ජාතික මට්ටමින් දිවයිනේ වැඩිම තැන්පතු රාශිකරණය කරන ලද කෙෂ්ත්‍ර සංවර්ධන නිලධාරීන් සඳහා ඇගයීම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරනු ඇත.(අනිවාර්ය ඉතුරුම් හැරම සමස්ත තැන්පතු ප්‍රමාණය)

**7.2** **වැඩිම ණය නිකුත් කිරිම:-**

පසුගිය වසර තුල ප්‍රාදේශීය මට්ටමේ, දිස්ත්‍රික් මට්ටමින් හා ජාතික මට්ටමින් දිවයිනේ වැඩිමණය නිකුත් කළ නිළධාරීන් ඇගයීමට ලක් කරනු ඇත. එහිදී අදාළ වසමේ බොල්ණය අනුපාත 3%ට වඩා අඩු විය යුතු අතර කල් පසු වූ ණය අනුපාත 10% ට වඩා අඩුවියයුතුය.
ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් අදාල නිලධාරීන් තෝරා ප්‍රතිඵල ජාතික මට්ටමට ඉදිරිපත් කල යුතුය. මෙහිදී දිස්ත්‍රික්කයට ප්‍රධාන වගකීම පැවරෙනු ඇත.

**7.3** පසුගිය වසර තුල චක්‍රලේඛ මගින් හදුන්වාදුන් විශේෂ වැඩසටහන් වලදී(අලුත් අවුරුදු ගණුදෙනු) වැඩිම දායකත්වයක් ලබාදුන් නිලධාරීන් ප්‍රාදේශිය මට්ටම, දිස්ත්‍රික් මට්ටමට හා ජාතික මට්ටමින් ඇගයීමට කටයුතු කෙරෙනු ඇත. එහිදී ඒ ඒ දිස්ත්‍රික්කයෙන් අප වෙත වාර්තා කල තොරතුරු අනුව එම ඇගයිම් කටයුතු සිදු කෙරෙනු ඇත.

**7.4** **ජාතික මට්ටමට ඇගයීම:-**

අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) පූර්ණ අධීක්ෂණය යටතේ කමිටුවක් මඟින් ඇගයීම් කටයුතු සිදුකරනු ඇත.

**8.0** <u>ඇගයීම් කාලය</u>

2015.12.31 සිට 2016.12.31 දක්වා වසරක කාලයකී.

ගණනය කිරීම් වලදි පාදක වර්ෂය ලෙස 2015.12.31 සිට දත්ත සලකා බලයි.

**9.0** <u>ක්‍රියාත්මක වන කාල පරාසය</u>

2016.01.01 - 2016.03.01 අතර කාල රාමුවක් ඉදිරිපත් කෙරේ. (ඇමුණුම අංක 03 මගින් ඉදිරිපත් කෙරේ.)

**10.0** <u>සම්බන්ධිකරණය සහ පසු විපරම්</u>

අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) අධීක්ෂණය යටතේ තොරතුරු කළමනාකරණය ඒකකය.

**11.0** <u>ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානය</u>

ඇගයීමට ලක් වන බැංකු, බැංකු සමිති හා ඊට අදාල නිලධාරින් වෙනුවෙන් පිරිනමනු ලබන ත්‍යාග හා සහතික පත් පිරිනැමීම සම්බන්ධයෙන් ඉදිරියේදී දැනුවත් කෙරෙන අතර, අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි අධ්‍යක්ෂ බැංකු මූල්‍ය විසින් සංවිධානය කරනු ලබන අමාත්‍යවරයා නියම කරනු ලබන දිනයකදී විෂය භාර අමාත්‍යවරයා හා අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් යුත් ජාතික උත්සවයකදී.

## 12.0 <u>පොදු කරුණු</u>

1. මෙමවැඩසටහනපිලිබඳව 2015.10.15 දිනැතිහාඅංකDDD/MF/MIS/05 ලිපියෙන් සියළුම බැංකු කලමණාකරුවන් දැනුවත් කර ඇත.
2. මෙම අභිප්‍රේරණ ක්‍රියාවලිය වඩාත් සර්ව සාධාරණ ස්වාධින එකක් විය යුතු අතර, අදාල රාජකාරි පැවරෙන නිලධාරින් එය අකුරටම ක්‍රියාත්මක කල යුතුය.
3. අදාල ඇමුණුම් මගින් සියළු මගපෙන්වීම් සිදුකර ඇති අතර, අදාල උපදෙස් මනාව අවබෝධ කර කාර්යය ඉටු කර දිය යුතුය.
4. අදාල වියදම් දැරිම සඳහා පොදු උපදෙස් ලබා දෙනු ඇත.
5. පත්කරන ලද ඇගයීම් කමිටු මණ්ඩලයේතීරණය අවසාන තීරණය වේ.

මෙම අභිප්‍රේරණ ක්‍රමවේදය පියවරෙන් පියවර වැඩි දියුණු කරමින් ඉදිරියට ගෙන යාමට අපේක්ෂා කරන අතර සෑම වසරකම ඇගයීම් ක්‍රමවේදය අඛණ්ඩව සිදුකිරීමට අපේක්ෂා කෙරේ.
ඉදිරි වර්ෂයේදී ප්‍රජාමූල බැංකු සමිති සඳහාද ශ්‍රේණිගත කිරිමේ වැඩසටහනක් සැලසුම් කර ඇත.

තව ද මීට අමතරව සමස්ථ බැංකු පද්ධතියට අදාළ සියළු කාර්ය මණ්ඩලය සඳහා කාර්ය සාධන ඇගයීම් වැඩ සටහනක් ක්‍රියාත්මත කිරීමට සැලසුම් කර ඇත.

මෙහි සඳහන් කරුණු සම්බන්ධව කිසියම් ගැටළුවක් හෝ පැහැදිලි කිරීමක් හෝ වේ නම් පහත දුරකථන අංක අමතන මෙන් වැඩි දුරටත් දන්වා සිටිමු.

<u>තොරතුරු කලමණාකරණ ඒකකයේ දූරකථන අංකය</u>

0112872227 - තොරතුරු කලමණාකරණ ඒකකය - කළමනාකරු - ඩබ්.රුක්මා මානෙල්.

**නීල් බණ්ඩාර හපුහින්න,**
අධ්‍යක්ෂ ජනරාල්.
දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

**පිටපත්:-**

1. ලේකම්,සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය - කා.දැ.ස
2. දිස්ත්‍රික් ලේකම්වරුන්/අතිරේක දිවිනැගුම අධ්‍යක්ෂ ජනරාල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස
3. සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - දැ.ගැ.ස
4. සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - දැ.ගැ.ස
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක,දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස